**ලංකා හොස්පිටල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2020**
**------------------------------------------------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
**---------------**

**1.1** මතය
**------**

ලංකා හොස්පිටල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ("සමාගම) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, ලාභාලාභ ප්‍රකාශය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2020** දෙසැම්බර් **31** දිනට නිකුත් කර ඇති නමුත් මාස හයක් ඇතුළත ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු.**5,458,065** ක් වුවද, නැවත වලංගු කිරීමට හෝ සාධාරණ කාලයකට පසුව ආදායමක් ලෙස හඳුනා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | පාලන යාන්ත්‍රණයට අනුව, මාස හයක් ඇතුළත උපලබ්ධි නොවූ චෙක්පත් අප විසින් ඉල්ලුම මත පියවිය යුතු බැවින් යල් පිනූ චෙක්පත් ගිණුමට මාරු කරනු ලැබේ. තවද, ඉහත ශේෂවලින් මූල්‍ය ප්‍රකාශනයට නැවත ගත හැකි ශේෂ පිළිබඳව විශ්ලේෂණය කර හඳුනාගෙන ඇත. වසර **5** කට වඩා වැඩි කාලයක් ඉක්මවා යෑමෙන් පසුව, අවශ්‍ය කළමනාකාරීත්ව අනුමැතිය ලබා ගත් වහාම, මෙම ශේෂ නැවත පොත්වලට ගැනීමට කටයුතු කරනු ඇත. | ශේෂය නිෂ්කාශනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගබඩා වෙත භාණ්ඩ ලැබුණු නමුත්, ගෙවීම් සඳහා ඉන්වොයිසි නොලද එකතුව රු.**16,313,028** ක් වූ අදාළ වටිනාකම අදාළ ණය හිමියාට වාර්තා නොකර ගෙවිය යුතු වෙළඳාම් සඳහා වෙන්කිරීම් ලෙස වාර්තා කර තිබිණි. | මෙය ගබඩාවලට ලැබුණු භාණ්ඩ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වන අතර ගෙවීම සඳහා ඉන්වොයිසි ලැබී නොතිබුණි. අවසාන ඉන්වොයිසි අපට ලැබෙන තෙක්, එක් එක් ණය හිමියා සඳහා ගෙවීම් කලින් වෙන් කර ගැනීමට අපට නොහැකි වේ. උපචිත පදනම මත ගිණුම් පිළියෙළ කර අවසන් කර ඇති බැවින්, වර්ෂය තුළ දරන ලද විශේෂිත වියදම් එම මූල්‍ය වර්ෂය තුළදීම ගිණුම්ගත කළ යුතුය. එම නිසා, වසර තුළ වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ යටතේ ලැබුණු සියලුම භාණ්ඩ සඳහා වෙන් කිරීම් අප විසින් සලසා ඇත. තවද, ගෙවීම් අදියරේ දී අවසන් ඉන්වොයිසිය මත පදනම්ව මෙම වෙන් කිරීම් ප්‍රතිවර්ත කරනු ලැබේ. | ශේෂය නිෂ්කාශනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **2003 ජූනි 02** දිනැති අංක **PED 12** දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| | (i) **9.7** වගන්තියට අනුව, වැටුප් සහ දීමනා අනුමත බඳවාගැනීම් සහ උසස්වීම් පටිපාටි මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව කිසිදු සංශෝධනයක් සිදු කිරීමට අවසර නොලැබේ. කෙසේ වුවද, සමාගම එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ලංකා හොස්පිට්ල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (LHD) යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස සංස්ථාපනය කළ සමාගමක් වන අතර ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන්ස් පීඑල්සී හි පූර්ණ අනුබද්ධිත පුද්ගලික සීමිත වගකීම් සමාගමක් වශයෙන් ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ රසායනාගාර කර්මාන්තය අතිශයින්ම තරඟකාරී කර්මාන්තයක් වන අතර, සාර්ථක වීමට සහ ක්ෂේත්‍රයේ වැදගත් වෛද්‍ය රසායනාගාර සේවා සපයන්නෙකු ලෙස පිළිගැනීමක් ලබා ගැනීමට, වෙළඳපොලේ අනෙකුත් පෞද්ගලික වෛද්‍ය රසායනාගාරවලට සමගාමීව සිය ක්‍රියාකාරකම් සිදු කිරීමට LHD සමාගමට සිදුවේ. එබැවින්, වෙළඳපොලේ තරඟකාරීව කටයුතු කිරීම සඳහා තරඟකාරී වැටුප් සහ වේතන සපයමින් කුසලතා සහිත දක්ෂ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට හා නඩත්තු කිරීමට LHD සමාගමට සිදුවේ. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| | (i) **9.2.**ඇ වගන්තියට අනුව, සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවද, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | -එම- | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සීමාව ඉක්මවා දුරකථන සහ ඉන්ධන දීමනා ප්‍රධාන විධායක නිලධාරියාට ලබාදී තිබුණි. | -එම- | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.366,611,362 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූප ලාභය රු.299,707,855 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.66,903,507 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

2.2 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2020 | 2019 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 4.36 වරක් | 4.04 වරක් |
| ක්ෂණික වත්කම් අනුපාතය | 3.93 වරක් | 3.67 වරක් |
| දළ ලාභ අනුපාතය | 60% | 59% |
| යොදන ලද ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය | 34% | 27% |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.4 ඡේදයට අනුව, ප්‍රසම්පාදනයේ මූලික වගකීම සමාගමේ ප්‍රධානියා විසින් දරනු ලබන අතර ඔහු විසින් ඔවුන්ගේ යටත් නිලධාරීන්ට අධිකාරි බලය පවරනු ලැබිය හැකිය. කෙසේ වුවද, අදාළ ප්‍රසම්පාදනය සඳහා අධිකාරි බලය පවරමින් ප්‍රසම්පාදන කමිටුවක් පත්කළ බවට සාක්ෂි නොතිබුණි. | ලංකා හොස්පිට්ල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා වෙනම ප්‍රසම්පාදන කමිටුවක් නොමැත. අපි ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීඑල්සී හි ප්‍රසම්පාදන කමිටුව අනුගමනය කරන්නෙමු. දැනට අපි ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති සියලුම අධිකාරි පැවරීම් ඇතුළත් ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීඑල්සී හි මූල්‍ය අධිකාරි සංදේශය (MOFA) අනුගමනය කරන්නෙමු. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.12 ඡේදයට අනුව, ප්‍රසම්පාදන කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් එහි පළමු රැස්වීමේදී නියමිත ආකෘතියෙන් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතුය. ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් විසින් ලබා දෙන ලද කිසිදු ප්‍රකාශයක් කිසිදු ප්‍රසම්පාදන ලිපිගොනුවක ඇතුළත්ව නොමැති බව නිරීක්ෂණය විය. | ඉහත සඳහන් කළ පරිදි, ලංකා හොස්පිට්ල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ප්‍රධාන බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රසම්පාදන කමිටුවක් පත් කර ඇති අතර එම ප්‍රසම්පාදන කමිටුව සඳහා මෙන්ම නිෂ්පාදනයේ වටිනාකම සහ ස්වභාවය මත පදනම්ව අනුමත කිරීමේ ආකෘතිය සඳහා ද අනුමතිය ලබා දී ඇත. එසේම, ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන මාර්ගෝපදේශය වෙනුවට ලංකා හොස්පිට්ල් | -එම- |

| | | | |
|---|---|---|---|
| | | කෝපරේෂන් පීඑල්සී සහ එහි අනුබද්ධ ආයතන සඳහා තමන්ගේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙළ කිරීම සඳහා මූල පුරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, සෑම අනුමත ආයතනයක් විසින්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙම ප්‍රකාශය එක් වරක් හෝ සිදු කර ඇත. | |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ **2.12** ඡේදයට අනුව, තාක්ෂණ ඇගයීම් කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් එහි පළමු රැස්වීමේදී නියමිත ආකෘතියෙන් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතුය. තාක්ෂණ ඇගයීම් කමිටු සාමාජිකයන් විසින් ලබා දෙන ලද කිසිදු ප්‍රකාශයක් කිසිදු ප්‍රසම්පාදන ලිපිගොනුවක ඇතුළත්ව නොමැති බව නිරීක්ෂණය විය. | නිර්දේශයට පසුව සහ තාක්ෂණික කමිටු සාමාජිකයින්ගේ අත්සන් යෙදීමට පෙර, තාක්ෂණික ඇගයීම් වාර්තාව අවසානයේ "ඉහත තීරණය සහ නිර්දේශය සඳහා මම සාමූහිකව සහ තනි තනිව වගකීම දරන්නෙමි" යන ප්‍රකාශය සඳහන් කරන ලෙස තාක්ෂණික කමිටු සාමාජිකයින් වෙත උපදෙස් ලබා දී ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. |
| (ඈ) | ලංසු විවෘත කිරීමේ කමිටුවේ සමහර සාමාජිකයින් කමිටු රැස්වීමට සහභාගීවී නොතිබුණු අතර ඔවුන් වෙනුවෙන් නියෝජිතයන් මෙම කමිටු රැස්වීමට සහභාගීවී තිබුණි. කෙසේ වුවද, එවැනි නියෝජිතයින් පත්කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලංකා හොස්පිට්ල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ලංසු විවෘත කිරීමේ කමිටුව සඳහා සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත ස්ථාවර නාමිකයන් පත් කර ඇත. සාමාන්‍යයෙන් ලංසු විවෘත කිරීමේ දිනට පෙර දිනයේ ලංසු විවෘත කිරීමේ රැස්වීම සඳහා සහභාගී වන ලෙසට ඉල්ලීමක් සංසරණය කරනු ලබන අතර ඇතැම් අවස්ථාවලදී සිදු කරනු ලබන ආකාරයට, නොවැළැක්විය හැකි හේතු මත අවම වශයෙන් සාමාජිකයන් තිදෙනෙකුගේ සහභාගීත්වයෙන් ලංසු විවෘත කිරීමේ සැසිය පැවැත්වීමට මෙම අවස්ථාවේ දී අපට සිදු විය. දැනට අපි අනුගමනය කරන්නේ ලංකා හොස්පිටල් ලංසු විවෘත කිරීමේ කමිටුවයි. | නියෝජිතයන් පත්කිරීම් නිසි ආකාරයෙන් සිදුකිරීමටත් ලේඛනගත සාක්ෂි තබා ගැනීමටත් ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ **2.11.2** ඡේදයට අනුව, කමිටුවේ ලේකම්වරයා විසින් වාර්තා කිරීමේ අරමුණු සඳහා සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතුවේ. සමාගමේ ප්‍රසම්පාදන ගොනුවෙන් කිසිදු පැමිණීමේ ලේඛනයක් සොයා ගැනීමට නොහැකි විය. | ලංකා හොස්පිට්ල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා වෙනම ප්‍රසම්පාදන කමිටුවක් නොමැත. ලංකා හොස්පිට්ල් කෝපරේෂන් හි ප්‍රසම්පාදන කමිටු ලේකම් විසින් වාර්තා කිරීමේ අරමුණ වෙනුවෙන් පැමිණීමේ ලේඛනයක් සහ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා පවත්වාගෙන ගොස් ඇත (ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් අත්සන් තබා ඇත). | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED/12 අනුව, මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණද, මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පත ඉදිරිපත් කර නොතිබුණි. | මෙම සමාගම ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී හි පූර්ණ අනුබද්ධිත ආයතනයකි. තවද, ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී විසින් ලංකා හොස්පිට්ල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට අදාළ තොරතුරු ද සමඟ සිය වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. එබැවින්, ලංකා හොස්පිට්ල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සඳහා වෙනම වාර්ෂික වාර්තාවක් ප්‍රකාශයට පත් නොකරන ලදී. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය. |